ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

**10 ශ්‍රේණිය**

**5.0 මූලික පොත්වල ගනුදෙනු සටහන් කර ලෙජරයට පිටපත් කරයි.**

**5.1 මුදලින් සිදුවන ගනුදෙනු වාර්තා කිරීම සඳහා මුදල් පොත පවත්වා ගනියි.**

**5.4 මුදල් වට්ටම් සම්බන්ධ ගනුදෙනු මුදල් පොතේ සටහන් කරයි**

**පැවරුම 03**

1. මහේල විසින් ලීබඩු අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි.ඔහු විසින් තම ව්‍යාපාරයට විකිණීමට අවශ්‍ය රු 100 000ක ලීබඩු තොගයක් ණයට මිලදී ගෙන ඇත.පසුදින ඔහු විසින් පෙරදින මිලදීගත් ලීබඩු තොගය සඳහා චෙක්පතක් සැපයුම්කරුට ලබා දී ඇත.ඔහු රු 50 000 ක අල්මාරියක් පාරිභෝගිකයෙකුට විකුණා එම අවස්ථාවේදීම මුදල් ලබා ගෙන ඇත.දැඩි හිතවතෙකු වූ ප්‍රසන්න පසුව මුදල් ලබාදෙන තෙක් ලී පුටු හයක් ඉල්ලා සිටි අතර මහේල රු 30 000 ක් වටිනා පුටු කට්ටලය ඔහුට ණයට විකුණන ලදී.ව්‍යාපාරයේ විදුලිබිල රු 4 200 ක් ගෙවීම ද සිදුවිය.ව්‍යාපාරයේ කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය පෑන් කාබන් කොල කිහිපයක් සඳහා රු 90 ක් වැය කොට ඒ අවස්ථාවේදීම එය ගිණුම්ගත කෙරිණි.සිංගර් සමාගමෙන් ව්‍යාපාරයේ පාවිච්චිය සඳහා වායු සමීකරණ යන්ත්‍රයක් රු 80 000ට ණයට මිලදී ගත් අතර ව්‍යාපාරයේ සිදුවන සියලු ගනුදෙනු මහේල විසින් ගිණුම්පොත්වල වාර්තා කරනු ලබයි.

අවශ්‍ය වන්නේ

ඉහත ඡේදය හොඳින් කියවා පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

1.පහත වගුව ගනුදෙනු සිදු වූ අනුපිළිවෙලට සම්පූර්ණ කරන්න.(උදාහරණය අනුගමනය කරන්න)

| ගනුදෙනුවේ ස්වභාවය | මූලික සටහන් පොත | මූලාශ්‍ර ලේඛනය |
|---|---|---|
| උදා- ණයට ගැනුම් | ගැනුම් ජර්නලය | ගැනුම් ඉංවොයිසිය |

2. ව්‍යාපාරිකයෙකු මූලික සටහන් පොත් පවත්වාගෙනයාමට හේතු 03ක් ලියන්න

3. මුදල් පොතේ ද්විත්ව කාර්යය නම් කරන්න.

4. මුදල් පොත හා සම්බන්ධ මූලාශ්‍ර ලේඛන 02ක් නම් කරන්න

5. මුදල් වට්ටම් යන්න පැහැදිලි කරන්න.

6. කුසිදුගේ ව්‍යාපාරයේ 2021 මැයි මස සිදු වූ ගනුදෙනු පහත දැක් වේ.

| | | |
|---|---|---|
| 2021.05.01 | ල.අ.01 | ප්‍රාග්ධනය රු 100 000 |
| 2021.05.03 | ල.අ.02 | අත්පිට විකුණුම් රු 20 000 |
| 2021.05.06 | ල.අ.03 | රු 200 000 බැංකුණයක් ගත්තා |
| 2021.05.07 | ව.අ.01 | අත්පිට ගැනුම් රු 30 000 |
| 2021.05.08 | | ණයට ගැනුම් රු 50 000 |
| 2021.05.10 | ල.අ.04 | අත්පිට් විකුණුම් වලින් ලැබුනා රු 60 000 |
| 2021.05.13 | ව.අ.02 | රු 20 000 ක ලී බඩු මිලදී ගත්තා |
| 2021.05.15 | ව.අ.03 | ගොඩනැගිලි කුලී ගෙව්වා රු 15 000 |
| 2021.05.18 | ල.අ.05 | කොමිස් ආදායම් ලැබුණා රු 12 000 |
| 2021.05.21 | ව.අ.04 | රු 2000 මුදල් ගැනිලි |
| 2021.05.24 | | ණයට විකුණුම් රු 35 000 |
| 2021.05.26 | ල.අ.06 | ඉසුරිගෙන් මුදල් ලැබුණා රු 15 500 |
| 2021.05.26 | ල.අ.07 | නිසල්ට රු 30 000 ණය ගෙවිමේදී අඩුකල වට්ටම් 5% කි |
| 2021.05.28 | ව.අ.05 | ඉසුරිගෙන් ලද මුදල රු 10 000 කි.අඩුකල වට්ටම රු 1500 කි. |

අවශ්‍ය වන්නේ

1.ගනුදෙනුවල ද්විත්ව සටහන ලියන්න.

2.වට්ටම් තීරු සහිත මුදල් පොත ඇතුළු ලෙජරයේ ගිණුම් වලට ගනුදෙනු පිටපත් කර තුලනය කරන්න.

3.මුදල් පොතේ සදහන් නොවන ගනුදෙනු නම් කරන්න.